(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 4(2).]

# පාර්ලිමේන්තුවේ අංක 4 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2026 ජූලි 22 බදාදා**

---

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා.127/2026

ගරු සජිත් ප්‍රේමදාස මහතා
ගරු දිලිත් ජයවීර මහතා
ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
ගරු ගයන්ත කරුණාතිලක මහතා
ගරු චාමර සම්පත් දසනායක මහතා
ගරු ජේ.සී. අලවතුවල මහතා
ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු කබීර් හෂීම් මහතා
ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
ගරු ඉම්රාන් මහරූෆ් මහතා
ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා
ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා
ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
ගරු අමිල ප්‍රසාද් මහතා
ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
ගරු බී. ආරියවංශ මහතා
ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා
ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය
ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා
ගරු චතුර ගලප්පත්ති මහතා
ගරු සුරංග රත්නායක මහතා
ගරු රෝහණ බංඩාර මහතා
ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු ජගත් විතාන මහතා

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු චානක මාදුගොඩ මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතාට එරෙහි විශ්වාස භංගත්වය,— 2026 ජූලි මස 05 සහ 06 යන දිනවල මීගමුව බන්ධනාගාරය තුළ රැඳවියන් කණ්ඩායම් අතර ඇති වූ ගැටුම් හේතුවෙන් බන්ධනාගාර නිලධාරින් සහ රැඳවියන් ඇතුළු පුද්ගලයන් 31 ක් මිය ගොස් ඇති අතර, 100කට වැඩි පිරිසක් තුවාල ලබා ඇති හෙයින්ද;

මෙය රටේ මෑත ඉතිහාසයේ බන්ධනාගාරයක් තුළ සිදු වූ බරපතලම ගැටුමක් වන අතර, එමඟින් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ පවතින බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය සහ ආරක්ෂක කළමනාකරණය පිළිබඳව බරපතල ගැටලු මතු වී ඇති හෙයින්ද;

මීගමුව බන්ධනාගාරයේ අවි ආයුධ හා ආරක්ෂිත උපකරණ සුරක්ෂිතව පවත්වා ගැනීමට අපොහොසත් වීම සහ රැඳවියන් අතර ගැටුම් වළක්වා ගැනීම සඳහා අවශ්‍ය පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග නොගැනීම යනාදිය බන්ධනාගාර පරිපාලනයේ දරුණු අකාර්යක්ෂමතාවයක් පෙන්නුම් කරන හෙයින්ද;

2026 ජූලි මස 05 ගැටුම ආරම්භ වූ දින එය නිරාකරණය කිරීම සඳහා කඩිනමින් ප්‍රමාණවත් සහ කාලෝචිත පියවර ගැනීමට අධිකරණ විෂය භාර අමාත්‍යවරයා අපොහොසත් වීම තුළ ජූලි මස 06 වන දින ගැටුම් තීව්‍ර වූ බැවින්ද;

පූර්ව සැලසුමකින් තොරව රාජ්‍ය නිලධාරින් වන බන්ධනාගාර නිලධාරින් ගැටුම සිදු වූ ස්ථානයට යොමු කිරීම තුළින් එම නිලධාරින්ගේ ජීවිත අනතුරකට දැමූ හෙයින්ද;

රාජ්‍ය බන්ධනාගාර පද්ධතිය තුළ රැඳවියන්ගේ හා නිලධාරින්ගේ ජීවිත ආරක්ෂා කිරීමේ අවසාන වගකීම දරන අධිකරණ විෂය භාර අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීමට අසමත් වී ඇති බව මෙම ගරු සභාව විශ්වාස කරන හෙයින්ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2024 නොවැම්බර් 25 දිනැති අංක 2412/08 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අධිකරණ විෂය භාර අමාත්‍යවරයාට පවරා ඇති බන්ධනාගාර ප්‍රතිසංස්කරණයට අදාළ ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම, බන්ධනාගාර පරිපාලනය හා ප්‍රතිසංස්කරණය සහ බන්ධනාගාරවල යටිතල පහසුකම් සංවර්ධනය හා තදබදය අඩු කිරීම යන කාර්යයන් වගකීම් සහිතව ඉටු කර නොමැති හෙයින්ද;

"පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ බන්ධනාගාරය සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට අමාත්‍යවරයා අපොහොසත් වීම තුළ ජනතාව විසින් ලබාදුන් ජනවරමට විරුද්ධ වී ඇති හෙයින්ද; සහ

ඉහත සඳහන් කළ කරුණු අනුව, අධිකරණ විෂය භාර අමාත්‍යවරයාට පැවරී ඇති කාර්යයන් වගකීමෙන් ඉටුකර නොමැති බැවින් සහ පැවරී ඇති කාර්යයන් පිළිබඳව අමාත්‍යවරයා වගවීමක් රහිතව කටයුතු කරන බව බැලූ බැල්මටම පෙනී යන හෙයින්;

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතාට තවදුරටත් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ධුරයේ කටයුතු නිසි පරිදි ඉටු කිරීමේ හැකියාව පිළිබඳව විශ්වාසයක් නොපවතින බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.